**කුසලතා පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරඟ විභාගය - 2017**

01. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.04.07 දිනැතිව අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව 2017.12.31 දිනට ගණනය කර ඇති මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 50% ක ප්‍රමාණයක් කුසලතා මත උසස් කිරීම මඟින් සම්පූර්ණ කරනු ලැබේ.

02. 2016.02.25 දිනැති හා අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 07/2016 වැටුප් ඛණ්ඩය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය 41,580/ - 11x755 - 10x1080 - 68,425/- ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිට වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

03. ඇගයීමේ ක්‍රමවේදය : -

අධි ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත් කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලබයි. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. එම මණ්ඩලය මඟින් ලකුණු ලබාදීමට තෝරා ගනු ලබන්නේ උක්ත සඳහන් ආකාරයට එක් එක් විෂයයට අවම ලකුණු 40 ක් ලබාගත් අයැදුම්කරුවන් පමණි. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට ද එම අයැදුම්කරුවන් නැවත පෙනී සිටිය යුතු අතර එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

| | | මුළු ලකුණු |
|---|---|---|
| I. | අභියෝග්‍යතාව සහ සිද්ධි අධ්‍යයනය (ලිඛිත පරීක්ෂණය) | - 100 (කාලය පැය 1 ½ යි) |
| II. | ජ්‍යෙෂ්ඨත්වය | - 60 |
| III. | පළපුරුද්ද | - 40 |
| | | 200 |

**I. අභියෝග්‍යතාවය සහ සිද්ධි අධ්‍යයනය - ලිඛිත පරීක්ෂණය (කාලය පැය 1 ½ යි ලකුණු100)**

මෙම පරීක්ෂණය පවත්වනු ලබන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ඇත. අභියෝග්‍යතාව සහ සිද්ධි අධ්‍යයනය වෙනුවෙන් වන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

(අ). පළමුවන කොටස (ලකුණු 40යි) :-

සියළුම ප්‍රශ්න කාර්යාල පරිපාලනයට සම්බන්ධ වන අතර එහිදී සාමාන්‍ය දැනීම, තීරණ ගැනීමේ හැකියාව, තාර්කික විසඳීම හා කාර්යාල පරිපාලනයට සම්බන්ධ ගැටළු ඉදිරිපත් කෙරෙනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ආ). දෙවන කොටස (ලකුණු 60යි) : -

අපේක්ෂකයන්ට කාර්යාල පරිපාලනයට සම්බන්ධ සිද්ධි අධ්‍යයන ගැටළුවකට අදාළව පිළිතුරු සැපයීමට සිදුවේ. මෙහිදී ඡේදයක් හෝ ඡේද කිහිපයක් ඇසුරෙන් ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

II. ජ්‍යෙෂ්ඨත්වය : -

ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු දෙනු ලබන්නේ නිලධරයෙකු මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එක් වසරක් සඳහා ලකුණු 06 බැගින් ලකුණු 60 ක උපරිමයක් දක්වා පමණි. මෙහිදී මාස 06 කට වැඩි වර්ෂයකට අඩු සේවා කාලයක් සඳහා ලකුණු 03 ක් ලැබෙන අතර, හය මාසයකට අඩු කාලයක් සඳහා ලකුණු දෙනු නොලැබේ.

III. පළපුරුද්ද : -

මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ අධීක්ෂණ නිලධාරියෙකු ලෙස සතුටුදායක එක් වසරක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40 ක උපරිමයක් දක්වා පළපුරුද්ද සඳහා ලකුණු ලැබේ.

සටහන : - මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. අයැදුම්කරුවන් ජ්‍යෙෂ්ඨතාවය සහ පළපුරුද්ද සම්බන්ධව ඇතුළත් කරන ලකුණු එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුව පදනම් කරගෙන ඇගයීමකට ලක් කරනු ලැබේ. මෙහිදී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයැදුම්කරුවන්ට සහ එම අයැදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ. පෞද්ගලික ලිපිගොනුවෙන් සනාථ නොවන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

04. මේ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය දෙසැම්බර් මස කොළඹදී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

05. සුදුසුකම් : -

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අයත්</u> නිලධාරීන්ට මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට කුසලතා පදනම මත උසස් කිරීම සඳහා අයැදුම් කිරීමට,

i. අයැදුම්පත් කැඳවන අවසාන දිනට මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

ii. එදිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

යන සුදුසුකම් සැපිරිය යුතුය.

06. අයදුම් කිරීමේ ක්‍රමය :-

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමු පිටුවටද 06 සිට 10 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන්වන සහ හතරවන පිටුවලටද ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 10ට අදාළ සඳහන් කරන පළපුරුද්ද සනාථ කිරීමට අදාළ ලිපිවල සහතික කරන ලද පිටපත් පළපුරුද්ද සඳහන් කරන පිළිවෙලට අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර පසු අවස්ථාවක ඉදිරිපත් කරන ලේඛන ලකුණු ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ. ලිපි මඟින් සනාථ වන සේවා කාලයන් වෙනුවෙන් පමණක් ලකුණු හිමි වනු ඇත. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අදාළ අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් සේවයට බැඳුන භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. **අයදුම්පත්‍රය සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කළ යුත්තේ තමන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂා මාධ්‍යයෙන්මය.** අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල බසට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ බසට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය වේ.

(ඇ) පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉහත සඳහන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 600කි. විභාගය පැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් එවනු ලබන බිල්පතට අනුව ගෙවීම් සිදු කිරීම සඳහා සහ එක් විභාග අපේක්ෂකයෙකු වෙනුවෙන් දැරීමට සිදුවන වියදම සලකා බලා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ඇති ගාස්තු චක්‍රයට අනුව මෙම ගාස්තුව අයකරන බව කාරුණිකව සඳහන් කරමි. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙසය. මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවන ලෙස අයදුම්කරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මොනම කරුණක් යටතේ වුවද මෙම විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසියම් විභාගයකට මාරු කිරීමටද ඉඩදෙනු නොලබන්නේය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා/අමාත්‍යාංශයේ ලේකම්වරයා මඟින් ලියාපදිංචි තැපෑලෙන් 2017.10.20 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර."** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ඒවා බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කුසලතා පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරඟ විභාගය - 2017"** යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඉ) නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන අයදුම්පත් තම කාර්යාලයට ලැබුණ දිනයේදීම කාර්යාලයීය දින මුද්‍රාව තැබීමටත්, පළපුරුද්ද සනාථ කරන ලේඛන සහ අයදුම්පතේ අංක 19 දැක්වෙන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය සහතික කර, සහතික කළ දිනයද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉහතින් දක්වන ලද ලිපිනයට ලැබෙන සේ එවීමටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා/අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කළ යුතුය.

(ඊ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදා හරිනු ලැබ ඇති/සේවය සඳහා ද්වීතීයනය කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කොට ඉහත දැක්වෙන ආකාරයට එවිය යුතුය.

(උ) නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන අයදුම්පත් පිළිබඳවද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද පැමිණිලි සලකා බලනු නොලැබේ.

(ඌ) මෙම කොමිෂන් සභා කාර්යාලයට ලැබී ඇති හා විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් වෙත යොමු කරනු ලබන අයදුම්පත්වලට අදාළ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි පළකරනු ලැබේ. එම නාමලේඛනයේ නම සඳහන් වී නොමැති අයදුම්කරුවන් වහාම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විමසන ලෙස උපදෙස් දෙනු ලැබේ.

(එ) අයදුම්කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, මේ සම්බන්ධ සියළු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදු වන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

07. විභාගයට ඇතුළත්වීම :-

(අ) ලිඛිත පරීක්ෂණය සඳහා වන අයදුම්පත් පිළිගත් සියළුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේදී එහි ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) විභාග අපේක්ෂකයන් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ පිටපතද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපතද, වෙබ් අඩවියේ පළකර ඇති අදාළ අනු අංකයද, අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මඟින් යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

සටහන : - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

08. අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනයන් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

09. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්:-

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. පත්වීම සඳහා තෝරා ගැනීම : -

ජ්‍යෝෂ්ඨත්වය, පළපුරුද්ද හා ලිඛිත පරීක්ෂණයෙන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව තෝරා ගනු ලැබේ. (ලිඛිත පරීක්ෂණය සඳහා අවම ලකුණු 40 ක් ලබා ගැනීම අනිවාර්ය වේ. එසේ 40 ක ලකුණු ලබා නොගන්නා අයදුම්කරුවන් මෙම පත්වීම සඳහා සුදුස්සන් නොවේ.)

11. විභාගයෙන් සමත්වන යම් අපේක්ෂකයකු එම පත්වීම පිරිනමන අවස්ථාවේදී බලපවත්වන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ පත්වීම ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ හැසිරීම් කරණකොටගෙන හෝ පත්වීම් නොදීමේ අයිතිය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමටද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණය ගැනීමටද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

13. මෙම දැන්වීමෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2017 ඔක්තෝබර් මස 02වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.